**ඒකාබද්ධ FAO/WFP ප්‍රවෘත්ති නිවේදනය**

2023 ජූනි 11

# ශ්‍රී ලංකාව තුළ ආහාර අනාරක්ෂිතතාව අඩු වෙයි, නමුත් නිශ්චිත කලාප වල ආහාර අනාරක්ෂිතතාව තවදුරටත් පවතී - FAO සහ WFP

*ඇස්තමේන්තුගත මිලියන 3.9 ක ජනතාවක් හෝ ජනගහනයෙන් සියයට 17 ක් ශ්‍රී ලංකාවේ, විශේෂයෙන් උතුරු, නැගෙනහිර සහ මධ්‍යම පළාත්වල මධ්‍යස්ථ උග්‍ර ආහාර අනාරක්ෂිතභාවයෙන් පෙළෙන අතර එය 2022 ට සාපේක්ෂව දියුණුවක් පෙන්නුම් කරයි.*

**කොළඹ:** එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සහ ලෝක ආහාර වැඩපිළිවෙල (WFP) ඒකාබද්ධව සිදුකරන ලද ආහාර භෝග සහ ආහාර සුරක්ෂිතතාව පිලිබඳ තක්සේරු මෙහෙයුම් (CFSAM) වාර්තාවට අනුව, ශ්‍රී ලංකාවේ සියළු ම පළාත් තුල ආහාර අනාරක්ෂිතතාව අඩු වෙමින් පවතී. එම වාර්තාව තක්සේරු කරන ආකාරයට, ජනගහණයෙන් සියයට 17ක් නොඑසේනම්, පුරවැසියන් මිලියන 3.9ක් මධ්‍යස්ථ උග්‍ර ආහාර අනාරක්ෂිතතාවට මුහුණ පාන අතර එය පසුගිය වර්ෂයේ ජූනි/ජූලි සමඟ සැසඳීමේදී ආසන්න වශයෙන් සියයට 40ක අඩු වීමකි. පසුගිය වසරේ දැඩි ආහාර අනාරක්ෂිතතාවයෙන් පෙළුණු 66,000ක පුද්ගල සංඛ්‍යාව මේ වසර වන විට, ආසන්න වශයෙන් 10,000ක් දක්වා අඩු වී ඇත.

මෙම ආහාර සුරක්ෂිතතා මට්ටම් වල වර්ධනයක් සටහන් වීමට මුලික පදනම් වී ඇත්තේ යහපත් ආහාර පරිභෝජනයයි. ආහාර මිල යම් තාක් අඩු වීම සහ මෙම වාර්තාවට කරුණු අධ්‍යනය කරන කාලය තුලදී අස්වනු නෙලීම හේතුවෙන් අදායම් මට්ටම් වර්ධනය වීම තුලින් ආහාර පරිභෝජන රටාවල වෙනසක් සිදුවීම වැනි කරනු ඊට බලපා ඇත.

මෙකී සාධනීය ප්‍රවණතාව දක්නට හැකි වුව ද, කිලිනොච්චිය, නුවර එළිය, මන්නාරම, මඩකලපුව, වවුනියාව සහ යාපනය වැනි ඇතැම් දිස්ත්‍රික්කවල ආහාර අනාරක්ෂිතතාව ඉහළ මට්ටමක පවතී. උග්‍ර ආහාර අනාරක්ෂිතතාව වාර්තා වන්නේ, වතුකරයේ තේ වගාකරුවන්ගේ ප්‍රජාවන් අතරින්, සහ සිය ප්‍රධාන ආදායම් මාර්ගය වශයෙන් සමෘද්ධි වැනි සමාජ ආධාර වැඩසටහන් මත යැපෙන දෛනික වැටුප් ලබාගන්නා කම්කරුවන් සහ කුටුම්භ අතරින් ය.

(2022)/23) වර්ෂවල ප්‍රධාන කන්න දෙක පුරාවට සහල් සහ බඩ ඉරිඟු ඇතුළු ධාන්‍ය වර්ග නිෂ්පාදනය ටොන් මිලියන 4.1ක් වශයෙන් පුරෝකථනය කර ඇත. මෙය පසුගිය වර්ෂ 5 සාමාන්‍යයට වඩා සියයට 14ක් අඩු ය. මීට ප්‍රධාන හේතුව වශයෙන් පොහොර සැපයුම ප්‍රමාණවත් නොවීම සහ අත්‍යාවශ්‍ය ද්‍රව්‍යමය යෙදවුම් දැරිය නොහැකි වීම හේතුවෙන් ඇති වූ දුර්වල ශාක පෝෂණය දැක්විය හැකි ය. කෙසේ වුව ද, බහුපාර්ශ්වීය සහ ද්වීපාර්ශ්වීය ආධාර ලෙස විවිධ රටවල් සහ නියෝජිතායතන මඟින් ලැබෙන අරමුදල් හරහා කුඩා පරිමාණ ගොවීන් සඳහා ලබාදුන් අත්‍යාවශ්‍ය පොහොර මඟින් නිෂ්පාදනයේ සැලකිය යුතු සාධනීය බලපෑමක් සිදු කර ඇත. මෑතක දී අස්වනු නෙළන ලද 2022/23 "මහ" කන්නයේ අස්වනු 2022 "යල" කන්නයට වඩා 12%ක වර්ධනයක් ද සනිටුහන් කර ඇත.

ශ්‍රී ලංකා සහ මාලදිවයිනේ FAO හි නියෝජිත විමලේන්ද්‍ර ශරන් මහතා CFSAM වාර්තාවේ සොයාගැනීම් පිළිබඳ දැක්වූයේ මෙවන් අදහසකි: "ආහාර බෝග සහ සුරක්ෂිතතාව පිළිබඳ තක්සේරු මෙහෙයුම් වාර්තාව යනු, ශ්‍රී ලංකාවේ ආහාර පද්ධතිය තුළ දිගින් දිගට ම පවතින දුර්වලතා සහ අභියෝග පිළිබඳ දැස් විවර කරවන වාර්තාවකි. මේ වාර්තාව සහ එහි සොයාගැනීම්, ප්‍රතිපත්ති සම්පාදකවරුන්ට සහ පාර්ශ්වකරුවන්ට ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට, ශ්‍රී ලංකික කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීමට සහ ආර්ථික අර්බුධයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ ගොවීන් මෙන්ම ග්‍රාමීය ප්‍රජාව විසින් මුහුණ පාන අවදානම් අවම කිරීම සඳහා සහයෝගීව කටයුතු කිරීමට මඟ පෙන්වනු ඇති බවට සැකයක් නොමැත.

තිරසාර ආහාර පද්ධති, ආහාර සුරක්ෂිතතාව සහ කුසගින්න නැති කිරීම යන අරමුණුවලට ළඟා වීම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයන් වෙනුවෙන් සහාය දැක්වීමට FAO සංවිධානය නිරන්තරයෙන් කැප වේ."

"අභියෝගවලින් පිරුණු මාස කිහිපයකට පසුව, රටේ ආහාර සුරක්ෂිතතාවේ වර්ධනයක් අපි අත්දකින්නෙමු" මෙසේ පැවසුයේ WFPහි ශ්‍රී ලංකා නියෝජිත සහ අධ්‍යක්ෂ අබ්දුර් රහීම් සිද්දීකී ය. "නමුත්, තවත් කළ යුතු දෑ බොහොමයි. කුටුම්භවලින් 60%ක් වැනි ඉහළ ප්‍රතිශතයක් ආහාර සපයාගැනීම සඳහා මුදල් ණයට ඉල්ලාගැනීම සහ ණය මඟින් ආහාර මිල දී ගැනීම වැනි ඍණාත්මක පියවර අනුගමනය කරමින් සිටී. ආහාර අනාරක්ෂිතතාවයෙන් පෙළෙන පුද්ගලයන් වශයෙන් හඳුනාගත් අය සඳහා ආහාර සලාක සහ මූල්‍යමය ආධාර සැපයීම සඳහා WFP විසින් පසුගිය වසරේ ආරම්භ කරන ලද හදිසි මෙහෙයුම තවදුරටත් පුළුල් කෙරෙනු ඇත."

**මෙහෙයුම් නිර්දේශ**

ඒකාබද්ධ FAO/WFP CFSAM මෙහෙයුම මඟින්, දැනට පවත්නා යල කන්නයේ නිෂ්පාදනය සහ ඵලදායීතාවය වැඩි කිරීම සඳහා පවත්නා පොහොර තොග මුදාහැරීම සහ (2023/24) වර්ෂවල මහ කන්නය සඳහා පොහොර ආනයනය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති කඩිනමින් සම්පාදනය කිරීමෙන් ගොවීන්ට අවශ්‍ය කඩිනම් සහාය සැපයීමට නිර්දේශ කරයි. පොහොර සහනාධාරය අවම කිරීම හෝ ඉවත් කිරීම සිදු කරනු ලබන්නේ නම්, ගොවීන්ට ඒ සඳහා අනුගත වීමට යම් කාලයක් ලබා දෙමින්, ක්‍රමානුකූලව අදියර කිහිපයකින් එය සිදු කළ යුතු බවත් වාර්තාව මඟින් නිර්දේශ කරනු ලබයි.

අනෙකුත් නිර්දේශ අතර, පොහොර ප්‍රසම්පාදනය සහ බෙදා හැරීම විධිමත් කිරීමට "පොහොර කාර්‍ය බලකායක්" පිහිටුවීම සහ පොහොර භාවිතයේ කාර්‍යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වන දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය සහ තිරසාර ගොවිතැන් පිළිවෙත් පිළිබඳ අනුවර්තන පර්යේෂණ ද කාර්යක්ෂම ලෙස දියත් කිරීම නිර්දේශ කරනු ලබයි. තවද, පශු සම්පත් සහ ධීවර ක්ෂේත්‍ර කෙරෙහි ඇති වන බලපෑම අවම කිරීම සඳහා, ආහාර සහ ආහාර බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ප්‍රමාණවත් සහයෝගයක් ලබා දෙන ලෙස ද මෙහෙයුම නිර්දේශ කරයි.

ආහාර අනාරක්ෂිතතාවයට බහුල වශයෙන් මුහුණ පාන ගෘහයන්ට ආහාර සහ/හෝ ආහාර ලබාගැනීම සඳහා ලබාදෙන මූල්‍යමය ආධාර දිගින් දිගට ම ලබාදීම වැඩිදුර නිර්දේශවලට ඇතුළත් වේ. ආහාර අනාරක්ෂිතතාවය පවතින ගෘහයන් විසින් අනාගතයේ අපහසු තත්වයන් හී දී අපහසුතාවයට පත්වීම වැලැක්වීම සඳහා දීර්ඝකාලීන වශයෙන් ජීවනෝපාය සහාය සහ එම තත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ගොඩ නැංවිය හැකි අන්දමේ වැඩසටහන් දියත් කිරීම ද නිර්දේශ කෙරේ.

<u>සංස්කාරකවරයා සඳහා සටහන්</u>

ඒකාබද්ධ බෝග සහ ආහාර සුරක්ෂිතතාව ඇගයීමේ මෙහෙයුම යනු, රජයේ ඉල්ලීම මත FAO සහ WFP විසින් රට තුළ සිදුකරගෙන යාමට නියමිත දෙවන මෙහෙයුමයි. මෙම මෙහෙයුම 2023 පෙබරවාරි සහ මාර්තු අතර දිවයිනේ සියළු ම දිස්ත්‍රික්ක (25) ආවරණය කරන ලද අතර ඇගයීමට ලක් කල තේමා අතර (2023) වසරේ කෘෂිකාර්මික නිෂ්පාදනය පුරෝකථනය සඳහා විශේෂයෙන් ම ප්‍රධාන ධාන්‍ය වර්ග දෙවර්ගය ද ගෘහස්ථ ආහාර සුරක්ෂිතතා තත්ත්වයන් තක්සේරු කිරීම සිදු කළේය.

**ඡයාරූපයඃ**

ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ FAOහි නියෝජිත විමලේන්ද්‍ර ශරන් සහ WFP ශ්‍රී ලංකා නියෝජිත සහ අධ්‍යක්ෂ අබ්දුර් රහීම් සිද්දීකී විසින් ශ්‍රී ලංකාව පිළිබඳ දෙවන ඒකාබද්ධ FAO-WFP බෝග සහ ආහාර සුරක්ෂිතතා ඇගයීම් මෙහෙයුම් (CFSAM) වාර්තාව කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීර මහතා වෙත භාරදෙන ලදි.

**FAO පිළිබඳව**

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) කුසගින්න පරාජය කිරීමේ ජාත්‍යන්තර ප්‍රයත්නයන්ට නායකත්වය ලබාදෙයි. එමඟින්, කෘෂිකාර්මික, වන වගා සහ ධීවර භාවිතයන් නවීකරණය කිරීමට සහ ශක්තිමත් කිරීමට, ඒවා වඩාත් තිරසාර කිරීමට සහ සැමට

ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීමට රටවලට උපකාර කරයි. ලෝකයේ දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් සහ කුසගින්නෙන් පෙළෙන බහුතරයක් වෙසෙන ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීම කෙරෙහි ඊට විශේෂ අවධානය යොමු කරයි. වැඩි විස්තර සඳහා ^***** www.fao.org වෙත පිවිසෙන්න, @FAOSriLanka @FAOnews @FAOknowledge යන ට්විටර් ගිණුම් හරහා අප හා සම්බන්ධ වන්න.

**WFP පිළිබඳව**

එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන යනු, හදිසි අවස්ථා වලදී ජීවිත බේරා ගනු ලබන සහ ආහාර ලබාදීම හරහා ගැටුම්, විපත් සහ දේශගුණික විපර්යාසවල බලපෑමෙන් මිදුනු පුද්ගලයින් සඳහා සාමය, ස්ථාවරත්වය සහ සමෘද්ධිය සඳහා වන මාවතක් ගොඩනගන ලොව විශාලතම මානුෂීය සංවිධානය යි.

Facebook, Instagram සහ Twitter හරහා අප සමඟ සම්බන්ධ වන්න. @WFPSriLanka

**වැඩිදුර තොරතුරු සඳහා:**

දිල්ශානි ඩයස්, ශ්‍රී ලංකා FAO , සන්නිවේදන | දූ.ක.:+94 77 015 2424 ඊ-මේල්:Dilshani.Dias@fao.org

ටාන්‍යා ජැන්ස්, ශ්‍රී ලංකා WFP , සන්නිවේදන | දූ.ක.:+94 7691 02462 ඊ-මේල්:tanya.jansz@wfp.org